# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2439/61 – 2025 ජුනි මස 05 වැනි බ්‍රහස්පතින්දා – 2025.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2015 දෙසැම්බර් මස 15 වැනි දින අංක 1945/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2015 අංක 231 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/328.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
WGSWD&EIP/ACQ/KB/18.

2025 මැයි මස 20 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්බෝව්ල, කටුවාවල සහ වේරහැර බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2012/1096 හා 2013.10.04 දිනැති අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 48 – වැකන්ද ඕවිට** ***හෙවත් රන් මුදුවාවල කුඹුර*** **– ප්‍රමාණය: හෙක්. 0.0434**

උතුරට: 10 කණුව පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම්; නැගෙනහිරට: 10 කණුව පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම සහ 10 කණුව පාරේ වරි. අංක 487/4 දරන ඉඩම; දකුණට: කැබලි අංක 47, 49 සහ 10 කණුව පාරේ වරි. අංක 492/2A දරන ඉඩම; බටහිරට: 10 කණුව පාරේ වරි. අංක 492/2A දරන ඉඩම සහ 10 කණුව පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම්.

EOG 06 – 0063



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1945/13 හා 2015.12.15 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2015 අංක 231 හා 2015.12.07 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව 1945/13 හා 2015.12.15 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2015 අංක 231 හා 2015.12.07 වැනි දින දරන ආඥාව මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල සම්බන්ධයෙන් පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/328.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
WGSWD&EIP/ACQ/KB/18.

2025 මැයි මස 20 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 577A, වේරහැර දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වේරහැර (කොට්ඨාස අංක 8 - බෝධිරාජපුර, බොරලැස්ගමුව මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2025/2 හා 2025.01.20 දිනැති අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – නින්දකුඹුර, හීන්ඉරවැල්ලකුඹුර, පිටකොටුවේකුඹුර සහ කඳුරුගහවලකුඹුර *හෙවත්* වලකඩවල – ප්‍රමාණය: හෙක්. 0.0352**

උතුරට: මු.පි.කො. 9839 හි කැබලි අංක 18, 10 කණුව පාරේ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම සහ වාච්චි හැන්නදිගේ දයාපාල හිමිකම් කියන 10 කණුව පාරේ වරි. අංක 487/4 දරන ඉඩම; නැගෙනහිරට: වාච්චි හැන්නදිගේ දයාපාල හිමිකම් කියන 10 කණුව පාරේ වරි. අංක 487/4 දරන ඉඩම සහ මු.පි.කො. 9839 හි කැබලි අංක 20; දකුණට: මු.පි.කො. 9839 හි කැබලි අංක 20 සහ 19; බටහිරට: මු.පි.කො. 9839 හි කැබලි අංක 19, තලගලගේ ඩඩ්ලි හේමචන්ද්‍ර හිමිකම් කියන 10 කණුව පාරේ වරි. අංක 492/2A දරන ඉඩම සහ මු.පි.කො. 9839 හි කැබලි අංක 18.

EOG 06 – 0064

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.